PRESS RELEASE

PR24/14

# ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරී කණ්ඩායම ශ්‍රී ලංකා සංචාරය නිමා කරයි

යම් රටක සංචාරයකින් පසු හඳුනා ගන්නා මූලික සොයාගැනීම් පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) කාර්යමණ්ඩල කණ්ඩායම්වල ප්‍රකාශ එම දූත මෙහෙය අවසානයේ නිකුත් කරන මාධ්‍ය නිවේදනයන්හි ඇතුළත් වේ. මෙම ප්‍රකාශයේ අන්තර්ගත අදහස් ජා.මූ. අරමුදලේ කාර්යමණ්ඩලයේ වන අතර එමගින් ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ අදහස් අවශ්‍යයෙන්ම නියෝජනය නොවේ. මෙම දූත මෙහෙය ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලයේ සාකච්ඡාවකට ලක් නොවේ.

- *ශ්‍රී ලංකා බලධාරීන් විසින් ක්‍රියාවට නංවන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන මගින් ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේ පළමු සලකුණු පෙන්නුම් කරයි. ඒ අනුව 2023 වසරේ තුන්වන කාර්තුවේදී ධනාත්මක මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, අඩු උද්ධමනය, ඉහළ ආදායම් රැස් කිරීම් සහ විදේශීය සංචිත ගොඩ නැගීම සිදු විය.*
- *ජනතාවට ප්‍රතිලාභ සැලසෙන, පූර්ණ සහ කල් පවත්නා පරිදි ආර්ථිකය නැවත ගොඩනැංවීම සහතික කරමින්, මෙම ආර්ථික ස්ථායීකරණය පුළුල් පදනමක් සහිත සහ ස්ථාවර වර්ධනයක් දක්වා වර්ධනය වීමට ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය මත රැඳී සිටීම අවශ්‍ය වේ.*
- *ජා.මූ. අරමුදලේ සහාය ලබන වැඩසටහන යටතේ ප්‍රධාන වගකීම් සපුරාලීමේ ප්‍රගතිය, විස්තීර්ණ ණය පහසුකමේ දෙවන සමාලෝචනය සහ ඉදිරියේදී නියමිත ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය විශ්ලේෂණය කෙරෙන 2024 වසරේ හතර වන වගන්තිය යටතේ වන (Article IV) උපදේශනය යටතේ විධිමත් ලෙස තක්සේරු කරනු ඇත.*

**කොළඹ, ශ්‍රී ලංකාව: – 2024 ජනවාරි 19:** මෑත කාලීන සාර්ව ආර්ථික ප්‍රවණතා සහ ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා පීටර් බෲවර් මහතාගේ නායකත්වයෙන් යුත් ජා. මූ. අරමුදලේ දූත කණ්ඩායමක් 2024 වසරේ ජනවාරි 11 සිට 19 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදුනි.

දූත මෙහෙය අවසානයේදී බෲවර් මහතා පහත ප්‍රකාශය නිකුත් කළේය:

"ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ පළමු සලකුණු පෙන්නුම් කරයි. මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2023 වසරේ තුන්වන කාර්තුවේදී වාර්ෂික පදනම මත සියයට 1.6 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කළ අතර එය අඛණ්ඩව කාර්තු හයකට පසුව වාර්තා වූ

පළමු වර්ධනය විය. අත්‍යවශ්‍ය භාණ්ඩ හිඟය අඩු වී ඇති අතර උද්ධමනය පාලනය වී ඇත. 2023 වසරේදී දළ ජාත්‍යන්තර සංචිත එ.ජ. ඩොලර් බිලියන 2.5 කින් වැඩි වූ අතර, මූලික දත්ත වලට අනුව 2023 වසරේ සිව්වන කාර්තුවේදී රාජ්‍ය ආදායම් එකතු කිරීමේ වැඩිවීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, මෙම වර්ධනයන් ශ්‍රී ලංකා ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම් බවට පරිවර්තනය කිරීම කෙරෙහි අභියෝග පවතියි.

"මෙම තත්ත්වය තුළ, ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව තිරසාරව පවත්වාගැනීම සහ සියළුම වැඩසටහන් වගකීම් නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම සහතික කිරීම, සියළු ජනයාට ප්‍රතිලාභ ලැබෙන පරිදි ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වීම ස්ථිර පදනමක් මත සිදු කිරීමට සහ විශ්වාසය යළි ගොඩනැගීම සඳහා ඉතා වැදගත් වේ. ආදායම මත පදනම් වූ ඒකාග්‍රතාවය පවත්වා ගනිමින් සාධාරණ ලෙස  බදුබර බෙදී යාම සහතික කිරීම සඳහා අනුක්‍රමික දේපළ බද්දක් හඳුන්වා දීම වේගවත් කිරීම වැදගත් වේ. ප්‍රතිසංස්කරණ වඩාත් තිරසාර කිරීමට සහ ණය තිරසාරභාවය යළි ලබා ගැනීමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන්ට සහාය වීමට  ණයහිමියන් අතර විශ්වාසය තවදුරටත් ගොඩනැංවීම සඳහා බදු පරිපාලනය ශක්තිමත් කිරීම, බදු නිදහස් කිරීම් ඉවත් කිරීම සහ බදු පැහැර හැරීම් සක්‍රීයව ඉවත් කිරීම සමග බදු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අවශ්‍ය වේ.

"උද්ධමනය පාලනය කිරීමෙහිලා ශ්‍රී ලංකා මහ බැංකුවේ සාර්ථකත්වය මත රැඳෙමින්, උද්ධමන අපේක්ෂාවන් මනාව පාලනය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් අනාගත මුදල් ප්‍රතිපත්ති තීරණ විචක්ෂණශීලීව ක්‍රියාත්මක කල යුතුය. අඛණ්ඩව පවතින අවිනිශ්චිතතාවයට එරෙහිව, ශක්තිමත් සංචිත රැස් කිරීමක් හරහා විදේශීය අංශයේ ස්වාරක්ෂක නැවත ගොඩනැගීම අඛණ්ඩව සිදු කිරීම වැදගත් වේ. වැඩිදියුණු කළ ඉලක්කගත කිරීමක් සහ වැඩි ආවරණයක් සහිතව මුදල් ප්‍රදාන තුළින් දුප්පතුන් සහ අවදානමට ලක්වූවන් ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ.

"මූල්‍ය අංශයේ ස්ථායීතාවය ආරක්ෂා කර ගැනීමට සහ එහි ආර්ථික වර්ධනයට සහාය වීමේ හැකියාව ශක්තිමත් කිරීමට, අරමුදලේ සහාය ලබන වැඩසටහන යටතේ අදාළ වගකීම් අනුව බැංකු පනතට අවශ්‍ය සංශෝධන කඩිනමින් අවසන් කිරීම, බැංකු ප්‍රාග්ධනකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සහ මූල්‍ය අධීක්ෂණය සහ අර්බුද කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම බලධාරීන් විසින් වහාම සිදු කළ යුතුය.

"ජා.මූ. අරමුදල විසින් පාලන නිර්ණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ඇති ප්‍රමුඛතා අවශ්‍යතාවයන්ට අමතරව, වාර්තාවේ ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා බලධාරීන් විසින් ඔවුන්ගේම ක්‍රියාකාරී සැලැස්මක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අතරම, පාලනය සහ විනිවිදභාවය යන අංශ වලට අදාළ ප්‍රතිසංස්කරණ සිදු කිරීමට හැකි පරිසරයක් සහතික කිරීම, මහජන විශ්වාසය ශක්තිමත් කිරීමට සහ මෙම වැදගත් ප්‍රයත්න ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමට මූලික වේ.

"ණය තිරසාරභාවය කරා යන මාවතකට ගෙන ඒම සමග බලධාරීන් ප්‍රශංසනීය ප්‍රගතියක් ලබා ඇත. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම ක්‍රියාත්මක කිරීම වැදගත් සන්ධිස්ථානයක් විය. නිල ණය හිමියන් සමග වන අවසන් ගිවිසුම් කඩිනමින් අවසන් කිරීම සහ බාහිර පෞද්ගලික ණය හිමියන් සමග එකගතාවයකට එළඹීම ඉතා වැදගත් වේ.

"ජා. මූ. අරමුදලේ සහාය ලබන වැඩසටහනෙහි ප්‍රධාන වගකීම් සපුරාලීමේ ප්‍රගතිය, ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය විශ්ලේෂණය කරන ජා.මූ. අරමුදලේ ඉදිරියේදී සිදුකිරීමට නියමිත 2024 වසරේ හතරවන වගන්තියට (Article IV) අදාළ උපදේශනය සමගින්, විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනෙහි දෙවන සමාලෝචනය තුළ දී විධිමත් ලෙස තක්සේරු කරනු ඇත.

"ජනාධිපති සහ මුදල් අමාත්‍ය රනිල් වික්‍රමසිංහ, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ, කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා, අමාත්‍ය කාංචන විජේසේකර මහතා, අමාත්‍ය විජයදාස රාජපක්ෂ මහතා, රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා, භාණ්ඩාගාර ලේකම් කේ.එම්. මහින්ද සිරිවර්ධන මහතා, උතුරු පළාත් ආණ්ඩුකාර පී.එස්.එම්. චාල්ස් මහත්මිය, නැගෙනහිර පළාත් ආණ්ඩුකාර සෙන්තිල් තොණ්ඩමන් මහතා ඇතුළු රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග ජා.මූ. අරමුදලේ කණ්ඩායම සාකච්ඡා පැවැත්වීය. ජා.මූ. අරමුදලේ කණ්ඩායම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පෞද්ගලික අංශයේ නියෝජිතයින්, සිවිල් සමාජ සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් ද හමුවිය.

"දූත පිරිස උතුරු හා නැගෙනහිර පළාත්වල කළ සංචාරය ඇතුළුව, දූත මෙහෙය අතරතුර ලබාදුන් විශිෂ්ට සහයෝගය වෙනුවෙන් බලධාරීන්ට ස්තූතිය පළ කිරීමට අපි කැමැත්තෙමු. මෙම සංචාරය ශ්‍රී ලංකාවේ අභියෝග මෙන්ම එහි ආර්ථිකමය විභවය පිළිබඳ දූත කණ්ඩායමේ අවබෝධය වැඩි දියුණු කළේය. අර්බුදයෙන් පසු ආර්ථිකය සම්පූර්ණයෙන් යථා තත්ත්වයට පත් වීම සඳහා ශ්‍රී ලංකාවට සහාය දැක්වීමට අපගේ කැපවීම අපි යළිත් තහවුරු කරමු."